සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක: 05/2026

මගේ අංකය:- PPSC/ES/15/FI/02/5
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත් සභාව
නව නගරය, රත්නපුර.
2026.03. 24

සබරගමුව පළාත් සභාවේ

01. ප්‍රධාන ලේකම්
02. සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
04. සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
05. පළාත් පාලන ආයතන ප්‍රධානීන්

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයෙහි සැලසුම් ශිල්පි III ශ්‍රේණියට සහ පුහුණු කිරීමේ ශ්‍රේණි (එක් වසරක හා දෙවසරක පුහුණු කාලය) තනතුරුවලට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර 2013.06.01 දින සිට ක්‍රියාත්මක වන සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට යටත්ව සහ ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/6/11/14 හා 2026.03.09 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමිය විසින් ලබා දී ඇති අනුමැතිය අනුව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පි පුරප්පාඩුවලින් 30% ක ප්‍රමාණයක් සීමිත ධාරාව යටතේ සම්පූර්ණ කිරීම සඳහා සැලසුම් ශිල්පි III ශ්‍රේණිය සහ පුහුණු කිරීමේ ශ්‍රේණි (එක් වසරක හා දෙවසරක පුහුණු කාලය සඳහා) වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එබැවින් මෙම චක්‍රලේඛ ලිපිය ඔබ ආයතනයේ සේවය කරනු ලබන අදාළ නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා වහාම යොමු කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

02. අයදුම් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම්

2. 1 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

2. 1. 1. පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

(අ). අධ්‍යාපන සුදුසුකම්
මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

(ආ). පළපුරුද්ද
ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

2. 1. 2. පුහුණු කිරීමේ ශ්‍රේණිය ( එක් වසරක පුහුණුව සඳහා)

(අ). අධ්‍යාපන සුදුසුකම්
මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව), ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

(ආ). වෘත්තීය සුදුසුකම්

පහත එක් සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

I. තෘතියික සහ වෘත්තීය අධ්‍යයන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලාවක් සාර්ථකව හදාරා අදාළ සහතිකය ලබා තිබීම

හෝ

II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් තිබීම

(ඇ) පළපුරුද්ද

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

2. 1. 3. III ශ්‍රේණිය

(අ). අධ්‍යාපන සුදුසුකම්

මව්බස (සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව) ගණිතය, විද්‍යාව යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

(ආ) වෘත්තීය සුදුසුකම්

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ 6) හයවන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

සටහන :- ඉහත III ශ්‍රේණියට අදාළ වෘත්තීය සුදුසුකම්වලින් එක් එක් අයිතමය යටතේ සැලසුම් ශිල්පී (සිවිල්) ක්ෂේත්‍රයට අදාළව වෘත්තීය සුදුසුකම ලබා තිබීම අනිවාර්ය වේ.

(ඇ) පළපුරුද්ද

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම

02.2 කායික සුදුසුකම්

සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

02.3 වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුයි.

II. නියමිත දිනට පූර්වාසන්නව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු වේ.

III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් 2026.04.10 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

03. තනතුරට අදාළ වැටුප් පරිමාණය

I. අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250- 10×800- 11×1190- 10×1320- 10×1350 - රු. 100,040/- වේ.

II. සැලසුම් ශිල්පී පුහුණු ශ්‍රේණිය සඳහා දීමනාව
බඳවා ගැනීම් පටිපාටියේ 7.5 (ඇ) ඡේදය අනුව, සීමිත ධාරාව යටතේ තෝරාගත් ආධුනිකයන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේදී පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් පවත්වන විභාගය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු කාලසීමාව සතුටුදායක ලෙස ගත කරන නිලධාරියකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් පියවරේම පිහිටුවනු ලබන අතර දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කොට විභාගය සමත්වීමෙන් පසු 2000.03.02 දිනැති අංක 07/2000 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය
සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය යොමු කර ඇති ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/11/4 හා 2026.03.09 දිනැති ලිපිය අනුව, මෙවරට පමණක් අදාළ වන සේ සීමිත පදනම යටතේ සැලසුම් ශිල්පී III ශ්‍රේණි සඳහා සෘජුව බඳවා ගනු ලබන අතර, පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) හා පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. පුහුණු කාලය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවත්වනු ලබන විභාගයෙන් සමත් වන්නන් III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර ඉන් අසමත් වන්නන් ඔවුන්ගේ පූර්ව තනතුරුවලට මුදා හැරේ.

05. ලිඛිත පරීක්ෂණය
(සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.)

(I) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01කි. (ලකුණු 100)

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(II) විෂයානුබද්ධ තාක්ෂණ පරීක්ෂණය - කාලය පැය 01 කි. (ලකුණු 100)

වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය ආදි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම, ගොඩනැගිලි ඉදි කිරීම් ද්‍රව්‍ය, ගොඩනැගිලි තාක්ෂණය, ගොඩනැගිලි සේවා, මැනීම හා මට්ටම් ගැනීම, මිනුම් ඒකක, පරිමාණ, සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදි විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

06. මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබයි. ඒ සඳහා ලකුණු ලබා නොදෙන අතර කායික යෝග්‍යතාවය හා සුදුසුකම්වලට අදාළ සහතික පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

07. විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතනවලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

08. අයදුම්පත් එවිය යුතු ආකාරය

මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව, අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්ද ඉතිරිය තුන්වන පිටුවටද වනසේද සකස්කර තම අත් අකුරින් නිවැරදිව හා පැහැදිළිව පුරවා (තමා සේවය කරන කාර්යාලයේ ප්‍රධානියා වෙත) **2026.04.10** දින නොඉක්මවා මෙම කොමිෂන් සභා කාර්යාලයට ලැබෙන සේ එවීම සඳහා භාරදිය යුතුය. අයදුම්පත්‍රය ඉහත නිවේදනය ප්‍රකාරව පිළියෙල කරගත යුතුවේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් තමන්ට ලැබෙන අයදුම්පත් ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු සමග පරීක්ෂා කර බලා අයදුම්පතේ සඳහන් තමාට සහතික කළ හැකි සියල්ල නිවැරදි බවට සහතික කර 2026.04.10 දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරෙහි **" සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී III ශ්‍රේණියට සහ පුහුණු කිරීමේ ශ්‍රේණියට සීමිත බඳවා ගැනීම - 2026"** ලෙස සඳහන් කළ යුතුයි. තවද ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර හා ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් තම අයදුම්පත්‍ර කල් ඇතිව නිවැරදිව පුරවා ආයතන ප්‍රධානීන්ට භාරදීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

09. උක්ත විභාගය සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛ ලිපියෙහි සඳහන් නොවූ කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

**ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත**

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ
අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයෙහි සැලසුම් ශිල්පී
III ශ්‍රේණියට සහ පුහුණු කිරීමේ ශ්‍රේණි (එක් වසරක හා දෙවසරක පුහුණු කාලය) තනතුරුවලට
සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

---

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**නිවේදනයට අනුව ඉල්ලුම් කරන තනතුරු නාමය :-**

01. අ. අයදුම්කරුගේ මුලකුරු සමග නම :-
(සිංහලෙන්)

ආ. මුලකුරු අගට යොදා මුලකුරු සමහ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම :-
( සිංහලෙන්)

ඇ. සම්පූර්ණ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. උපන්දිනය :- වර්ෂය මාසය දිනය

03. I. වර්තමාන සේවා ස්ථානය හා එහි ලිපිනය :-
(මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලැබේ)

II. පෞද්ගලික ලිපිනය :-

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :-
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ජාතික හැඳුනුම්පත් අංකය:-

06. දුරකථන අංකය:-

07. අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාර පවත්වනු ලබන ලිඛිත විභාගයට ඔබ පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය සඳහන් කරන්න :-
(සිංහල/දෙමළ භාෂා මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ.)

08. I. දැනට දරන තනතුර :-
II. එම තනතුරට පත්වූ දිනය :-

09. ඔබ තනතුරෙහි ස්ථිර කර තිබේද යන්න :-

10. අධ්‍යාපන සුදුසුකම්:-

අ.පො.ස(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර)

වර්ෂය:- විභාග අංකය:-

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවනවර)

වර්ෂය:- විභාග අංකය:-

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද:

වෘත්තීය සුදුසුකම් (වලංගු දිනය සඳහන් සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුවේ)

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

පළපුරුද්ද (ලිඛිතව සනාථ කළ යුතුවේ)

| ආයතනය | ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුර | අදාළ ක්ෂේත්‍රයේ සේවා කාලය |
|---|---|---|
| | | |

12. විභාග ගාස්තු ගෙවීම සම්බන්ධ තොරතුරු

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය:-

විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-

මුදල් ගෙවා ලබා ගන්නා ලද රු. 600/ - ක් වටිනා ලදුපත
නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

34-74

13. තම සේවා කාලය තුළදී විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද? එසේ නම් වරදේ ස්වභාවය, දුන් දඬුවම හා දඬුවම් කළ දිනය ආදී තොරතුරු:

.........................................................................................................

.........................................................................................................

.........................................................................................................

14. ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක හෝ 05 ක (ඉල්ලුම් කරන තනතුරට අදාළ වන පරිදි ) සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබේද ?

.........................................................................................................

15. පසුගිය වර්ෂ 05 ක සේවා කාලය තුළ උපයාගත හැකිව තිබුණ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ( වැටුප් වර්ධකයක් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු දැක්විය යුතුය)

.........................................................................................................

.........................................................................................................

16. ඔබට විරුද්ධව දැනට විනයානුකූල කටයුත්තක් ආරම්භ කර තිබේද? (එසේ නම් ඒ පිළිබඳ තොරතුරු දැක්විය යුතුය)

.........................................................................................................

.........................................................................................................

.........................................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය : -

..........................................

අයදුම්කරුගේ අත්සන

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.................................................................................................... මයා/මිය/මෙනවිය දැනට ....................................................................මෙම ආයතනයේ .................................................... වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක් ගෙවා එම ලදුපත අයදුම්පත්‍රයේ අලවා ඇති බවත්, අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාර සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ *කාර්මික නිලධාරි(සිවිල්) III ශ්‍රේණියට / පුහුණු ශ්‍රේණියට (එක් වසරක පුහුණු කාලය) / පුහුණු ශ්‍රේණියට (දෙවසරක පුහුණු කාලය) අයදුම් කිරීමට නිලධාරියා /නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බවත් අයදුම්පත්‍රයේ අංක 01 සිට 16 දක්වා ඡේද යටතේ නිලධාරියා/ නිලධාරිනිය සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/මැයගේ පෞද්ගලික ලිපිගොනුව හා මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම නිලධාරියාට/නිලධාරිනියට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි.

වෙනත් නිරීක්ෂණ / නිර්දේශ :

.........................................................................................................

.........................................................................................................

දිනය :-

..........................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

( නිල මුද්‍රාව තබන්න)

* අනවශ්‍ය වචන කපා හරින්න